SC

# ඓතිහාසික ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ දායකත්වය සහ යාපනය රාජධානිය

FGS/H/MSSc/2007/11

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ ඉතිහාසය පිළිබඳ
සමාජීය විද්‍යාපති උපාධිය සඳහා ඉදිරිපත් කරන ලදි.

2009 - අගෝස්තු


| | |
|---|---|
| ප්‍රවේශ අංකය | 615 |
| වර්ග අංකය | |

# නිබන්ධ සාරාංශය

ඓතිහාසික ශ්‍රී ලංකාවේ ද්‍රවිඩ දායකත්වය සහ යාපනය රාජධානිය මැයෙන් ඉදිරිපත් කරන මෙම නිබන්ධනය තුළින් විමර්ශනයට ලක් කරන ලද්දේ සිංහල රාජධානිය තුළ ද්‍රවිඩ දායකත්වය සහ වර්තමානයේ ද්‍රවිඩ උපනිවේශයක් බවට පත් වී තිබෙන යාපනය ආශ්‍රිත ප්‍රදේශයේ පැවති ප්‍රදේශීය ද්‍රවිඩ රාජධානියේ ඉතිහාසය හා ප්‍රදේශයේ සිංහල බෞද්ධ උරුමය කෙරෙහි ය. එහි දී පර්යේෂණයට අදාළ කාල පරිච්ඡේදය අලළා ලියවුණ ප්‍රාථමික මූලාශ්‍රය, ද්විතික මූලාශ්‍රය, අභිලේඛන හා වාස්තු විද්‍යාත්මක නෂ්ටාවශේෂ ආදි නොයෙක් මූලාශ්‍රයන් මඟින් තොරතුරු ලබාගන්නා ලදි.

එසේ ලබාගත් තොරතුරු සමාලෝචනය කරමින් ද්‍රවිඩයන් හඳුනාගැනීම, ඔවුන් සිංහල රාජධානියට කළ දේශපාලන බලපෑම්, සංස්කෘතික දායකත්වය, යාපනය රාජ්‍යයේ ආරම්භය හා විකාශනය, ඒ ප්‍රදේශයේ ඓතිහාසික සිංහල බෞද්ධ උරුමය ආදි ක්ෂේත්‍ර කෙරෙහි පුළුල් අවධානයක් යොමු කරන ලදි. ඒ අනුව හෙළිවුණ ප්‍රධාන කරුණ නම් පුරාණයේ සිට ම ද්‍රවිඩයන් මෙරට ජීවත් වූ බවත් යාපනය ප්‍රාදේශිය රාජධානියේ ආරම්භය දාහතරවන සියවසේ දී පමණ ජාවකයන් නිසා සිදුවුණ බවත් ය.

මේ මඟින් එළඹිය හැකි නිගමනය නම් ද්‍රවිඩයන්ට මෙරට නිජබිමක් නොමැති බවයි. නමුත් ඔවුන්ට පුරාණයේ සිට ම පැවති මෙරට ජීවත්වීමේ අයිතිය කිසිසේත් ම උදුරාගත නො හැකි බවයි.

පුස්තකාලය
කැලණිය විශ්වවිද්‍යාලය (ශ්‍රී ලංකාව)
කැලණිය.